IslamHouse.com
Osoul Center
www.osoulcenter.com
Rabwah

Sinhala
සිංහල
سنهالي

# ඒකීය අල්ලාහ් වෙත පමණක් නැඹුරු වීම අනිවාර්ය බව හඟවන පැහැදිලි සාධකය

කතෘ
අබ්දුල්ලාහ් බින් අබ්දුර්රහ්මාන් අස් සඅද්

සිංහලෙන්
මුහම්මද් අකීල් මුහම්මද් අමීන්

විචාරය කිරීම
සයියිද් ඉර්ෂාද් මවුලානා

# البرهان
## في وجوب اللجوء إلى الواحد الديان

**تأليف**

عبد الله بن عبد الرحمن السعد

**ترجمة**

محمد حقيل محمد أمين

**مراجعة**

سيد إرشاد مولانا

සිංහල

sinhala

سنهالي

ⓒ المكتب التعاوني للدعوة والإرشاد و توعية الجاليات بالربوة، ١٤٣٩هـ
فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر
السعد، عبدالله عبدالرحن
البرهان في وحوب الاجوء إلى الواحد الديان – سنهالي. / عبدالله عبدالرحن السعد. - الرياض، ١٤٣٩هـ
٥٦ ص، ١٢سم x ١٦،٥سم
**ردمك : ٩-٣٠-٨٢٢٩-٦٠٣-٩٧٨**
١- الإيمان (الاسلام)　　٣- الوعظ والارشاد　　أ. العنوان
ديوي ٢٤٠　　١٤٣٩/٣٠٨٩
رقم الايداع: ١٤٣٩/٣٠٩١
**ردمك : ٩-٣٠-٨٢٢٩-٦٠٣-٩٧٨**

Osoul Center

*මෙම පොත උසූල් අන්තර්ජාතික මධ්‍යස්ථානය විසින් සංස්කරණය කොට ඇති අතර මෙහි භාවිතා කර ඇති සියලුම ඡායාරූපවලට හිමිකම් ලබනුයේ එම ආයතනයයි. පහත සඳහන් කොන්දේසි දෙක මත ඕනෑම අයුරින් මෙම පොත නැවත ප්‍රකාශයට පත් කිරීමට අවසර ඇත.1: මෙම මධ්‍යස්ථානයෙහි අවසරය හා පිළිගැනීම සියලු සංස්කරණ මත පැහැදිලිව සඳහන් විය යුතුයි. 2: මෙම මධ්‍යස්ථානය වෙත යොමු නොකොට කිසිදු වෙනසක් හෝ සංශෝධනයක් කිරීමට නොහැක. මෙම පොත නැවත මුද්‍රණය කිරීමේදී උසස් ප්‍රමිතිය පවත්වා ගැනීමට මධ්‍යස්ථානය දැඩි ලෙස නිර්දේශ කරයි.*

+966 50 444 2532
+966 11 445 4900
+966 11 497 0126
B.O.Box. 29465 - Riyadh 11457
osoul@rabwah.com
www.osoulcenter.com




අපරිමිත දයාන්විත අසමසම

කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි,

# පෙරවදන

සියලු ප්‍රශංසා අල්ලාහ්ට හිමිවේවා! අපි ඔහු ප්‍රශංසා කරමු. ඔහුගෙන්ම පිහිට පතමු. ඔහුගෙන්ම ක්ෂමාව අයැදිමු. අපගේ සිත් තුළ ඇති විය හැකි නපුරින් හා අපගේ අයහපත් ක්‍රියාවලින් මිදීමට අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතමු.

"නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැත. ඔහු ඒකීයෙකි. ඔහුට සමාන කිසිවෙක් නැත." යනුවෙන් ද "මුහම්මද් (සල්) තුමාණෝ අල්ලාහ්ගේ වහලා සහ දූතයා" යනුවෙන් ද සාක්ෂි දරමු.

දරු පල ලැබ ගැනීම,ලෙඩ රෝග සුව කිරීම,සහනය ලබා දීම,ගැටළු වලින් මුදවා ගැනීම වැනි විෂයන් නියමිත ආකාරයෙන් සපුරා දිය හැක්කේ සර්ව බලධාරී ඒකීය දෙවිඳුන් වන අල්ලාහ්ට පමණි.එම විෂයෙහි ඔහු හැර අන් අයෙකුගෙන් පිහිට පැතීම යනු වර්තමානයේ සාමාන්‍ය ජනයින් අතර බහුලව ව්‍යාප්ත වී ඇති ආකාරය දැක ගන්නට පුළුවණි. ඉස්ලාම් දහමට අනුව මෙසේ අල්ලාහ් හැර අන් කෙනෙකුගෙන් පිහිට පැතීම යනු තහනම් කරන ලද කරුණකි.එපමණක් නොව මෙය ජාහිලියියා හෙවත් අඥාන යුගයේ පැවති ක්‍රමවේදයක් වන අතර අල්ලාහ්ට ආදේශ කිරීමට සමාන පාපයකි යන්න නිසැකය.මේ

ආකාරයෙන් අල්ලාහ් හැර අන් කෙනෙකුගෙන් පිහිට පැතීම හෝ ප්‍රාර්ථනා කිරීම තහනම් වීමට පැහැදිලි සාධක රාශියක් තිබෙන අතර එයින් සාධක දහයක් මෙම කුඩා කෘතිය මඟින් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන්නෙමි.

ඔබේ අවධානය පිණිස....

මෙම කුඩා කෘතියෙහි දහවන සාධකයේ සත්‍යතාවය තහවුරු කළ නොහැකි පුවත් පරිවර්තකයා විසින් පරිවර්තනය නොකළ බව අවධාරනය කර සිටිමු.

1

# සාධක අංක

උත්තරීතර අල්ලාහ් ඔහු හැර අන් කිසිවෙකුගෙන් පිහිට පැතීම හෝ ප්‍රාර්ථනා කිරීම තහනම් කර ඇත.ඒ අනුව නබි (සල්) තුමාණන් දෙස බලා අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ අණ කරයි:

﴿ وَلَا تَدۡعُ مِن دُونِ ٱللَّهِ مَا لَا يَنفَعُكَ وَلَا يَضُرُّكَۖ فَإِن فَعَلۡتَ فَإِنَّكَ إِذٗا مِّنَ ٱلظَّٰلِمِينَ ﴾ [يونس: ١٠٦]

අල්ලාහ් හැර ඔබට යහපතක් හෝ අයහපතක් හෝ කළ නොහැකි දේ වෙත ප්‍රාර්ථනා නොකරන්න. (එසේ) කළහොත් ඔබ අපරාධකරුවෙක් වන්නෙහි ය. (යූනුස්:106)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

﴿ وَمَنۡ أَضَلُّ مِمَّن يَدۡعُواْ مِن دُونِ ٱللَّهِ مَن لَّا يَسۡتَجِيبُ لَهُۥٓ إِلَىٰ يَوۡمِ ٱلۡقِيَٰمَةِ وَهُمۡ عَن دُعَآئِهِمۡ غَٰفِلُونَ ٥ وَإِذَا حُشِرَ ٱلنَّاسُ كَانُواْ لَهُمۡ أَعۡدَآءٗ وَكَانُواْ بِعِبَادَتِهِمۡ كَٰفِرِينَ ﴾

[الأحقاف: ٥، ٦]

කියාමත් දින තෙක් තමන්ට පිළිතුරු නොදෙන, අල්ලාහ් නොවන අය කැඳවන්නාට වඩා ඉතා දුර් මාර්ගිකයා කවරෙක් ද? ඔවුහු තමන් කැඳවීම ගැන නොදැනුවත් ව සිටිති.ජනතාව එක් රැස් කරනු ලබන විට ඔවුහු මොවුනට

සතුරන් බවට පත් වෙති. මොවුහු තමන්ට නැමදුම් කිරීම ද ප්‍රතික්ෂේප කරති. (අහ්කාෆ්:5/6)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

﴿وَأَنَّ ٱلۡمَسَٰجِدَ لِلَّهِ فَلَا تَدۡعُواْ مَعَ ٱللَّهِ أَحَدٗا﴾ [الجن: ١٨]

මස්ජිදයන් අල්ලාහ්ට ම හිමිය. එබැවින් අල්ලාහ් සමඟ අන් කිසිවෙක් නොකැඳවන්න. (ජින්: 18)

මෙම මාතෘකාවට අදාල වෙනත් වැකි රාශියක් අල්කුර්ආනයේ සඳහන් වී ඇත.

## 2

# සාධක අංක

**සර්ව බලධාරී අල්ලාහ් ඔහු වෙත පමණක් ප්‍රාර්ථනාවන් ඉදිරිපත් කරන ලෙස අණ කර ඇත.ඒ පිළිබඳ පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ සඳහන් කරයි:**

﴿وَقَالَ رَبُّكُمُ ٱدۡعُونِيٓ أَسۡتَجِبۡ لَكُمۡۚ إِنَّ ٱلَّذِينَ يَسۡتَكۡبِرُونَ عَنۡ عِبَادَتِي سَيَدۡخُلُونَ جَهَنَّمَ دَاخِرِينَ﴾ [غافر: ٦٠]

“මා කැඳවන්න. මම නුඹලාට පිළිතුරු දෙමි. මාගේ නැමදුම කෙරෙන් උඩඟු වූ අය නින්දිත අය ලෙසින් නිරයට පිවිසෙති” යි නුඹලාගේ දෙවියන් පවසයි. (ගාෆිර්:60)

﴿وَإِذَا سَأَلَكَ عِبَادِي عَنِّي فَإِنِّي قَرِيبٌۖ أُجِيبُ دَعۡوَةَ ٱلدَّاعِ إِذَا دَعَانِۖ فَلۡيَسۡتَجِيبُواْ لِي وَلۡيُؤۡمِنُواْ بِي لَعَلَّهُمۡ يَرۡشُدُونَ﴾ [البقرة: ١٨٦]

මාගේ වහලුන් මා ගැන ඔබගෙන් විමසුවේ නම් “මම සමීපව සිටින්නෙක්මි. ප්‍රාර්ථනා කරන්නා මා වෙත ප්‍රාර්ථනා කරන විට (ඔහුගේ) ප්‍රාර්ථනාවට පිළිතුරු දෙන්නෙමි. එබැවින් මා වෙත ම ප්‍රාර්ථනා කරත්වා! මා ගැන ම විශ්වාස කරත්වා! මෙයින් ඔවුහු යහ මග ලබති” (යි පවසන්න). (බකරා:186)

﴿أَمَّن يُجِيبُ ٱلۡمُضۡطَرَّ إِذَا دَعَاهُ وَيَكۡشِفُ ٱلسُّوٓءَ وَيَجۡعَلُكُمۡ خُلَفَآءَ ٱلۡأَرۡضِۗ أَءِلَٰهٞ مَّعَ ٱللَّهِۚ قَلِيلٗا مَّا تَذَكَّرُونَ﴾ [النمل: ٦٢]

(විපතක පැටලී) දඟලමින් සිටින අය (ආරක්ෂාව පතා) ආරාධනා කළහොත් (ඔවුන්ට) පිළිතුරු දී, ඔවුන්ගේ අමාරුකම් පහ කරන්නේ කවරෙක්ද? භූමියෙහි ඔබව (තමන්ගේ) නියෝජිතයින් වශයෙන් පත් කළේ කවරෙක්ද? (මෙවැනි) අල්ලාහ් සමග නැමදුමට යුතු (වෙන කෙනෙකු) සිටින්නෙහිද? (ඇත්තේම නැත). ඔබ (මේ ගැන) සිතන්නේ ඉතාමත් අල්පයකි. (නම්ල්:62)

මෙසේ මිනිසෙකුගේ අසීරුතාවයන් පහ කිරීම සඳහා අල්ලාහ් හැර අන් කිසිවෙකුට ශක්තියක් තිබේද? එයට පිළිතුර නම් නැත යන්නයි.ඒ සඳහා සුදුසුකම් ලද්දා ඒකීය අල්ලාහ් පමණී.

තවද අල්ලාහ් මෙසේ පවසයි:

﴿ قُلۡ أَمَرَ رَبِّي بِٱلۡقِسۡطِۖ وَأَقِيمُواْ وُجُوهَكُمۡ عِندَ كُلِّ مَسۡجِدٖ وَٱدۡعُوهُ مُخۡلِصِينَ لَهُ ٱلدِّينَۚ كَمَا بَدَأَكُمۡ تَعُودُونَ ﴾ [الأعراف: ٢٩]

මාගේ රබ්(පරමාධිපති) යුක්තිය ඉටුකරන ලෙස අණ කර ඇත. තවද නැමදුම් කරන සියලු තැනකම නුඹලා නුඹලාගේ මුහුණු (ඔහු වෙතම) යොමු කරන ලෙසත් තවද ඔහුට පමණක් අවංක වී ඔහුගෙන්ම කන්නලව් කරන ලෙසත් මාගේ රබ්(පරමාධිපති) අණකර ඇත. දැනට නුඹලා මවා ඇති ආකාරයෙන්ම නුඹලා නැවතත් පැමිණෙන්නාහුයැයි (නබි මුහම්මද්) පවසනු. (අඃරාෆ්:29)

තවද අල්ලාහ් මෙසේ පවසයි:

﴿ هُوَ ٱلۡحَيُّ لَآ إِلَٰهَ إِلَّا هُوَ فَٱدۡعُوهُ مُخۡلِصِينَ لَهُ ٱلدِّينَۗ ٱلۡحَمۡدُ لِلَّهِ رَبِّ ٱلۡعَٰلَمِينَ ﴾ [غافر: ٦٥]

ඔහුම අමරණීයයයි. ඔහු හැර, වෙන කිසිම දෙවියෙකු නැත. එබැවින් "(මිනිසුනේ!) ඔබ සම්පූර්ණයෙන්ම පරිශුද්ධ මනසින් යුතුව ඔහුව කැඳවනු මැනව! (මන්දයත්) නැමදුම් පිළිවෙත් සියල්ල ඔහුටම අයත්ය. (සකල) ලෝකයන්ද උත්පාදනය කර, පෝෂණය කර, සංරක්ෂණය කරන අල්ලාහ්ටම සියලූ ප්‍රශංසා අයත්ය" (යයිද පවසනු මැනව!). (ගාෆිර්:65)

තවද අල්ලාහ් මෙසේ පවසයි:

﴿ ٱدۡعُواْ رَبَّكُمۡ تَضَرُّعٗا وَخُفۡيَةًۚ إِنَّهُۥ لَا يُحِبُّ ٱلۡمُعۡتَدِينَ ٥٥ وَلَا تُفۡسِدُواْ فِي ٱلۡأَرۡضِ بَعۡدَ إِصۡلَٰحِهَا وَٱدۡعُوهُ خَوۡفٗا وَطَمَعًاۚ إِنَّ رَحۡمَتَ ٱللَّهِ قَرِيبٞ مِّنَ ٱلۡمُحۡسِنِينَ ﴾ [الأعراف: ٥٥-٥٦]

නුඹලාගේ රබ්(පරමාධිපති)ගෙන් බැගෑපත්වද නිහඬවද අයදිනු. නියත වශයෙන් ඔහු සීමාව ඉක්මවන්නන් ප්‍රිය නොකරන්නේය.එය (මහපොළොව) නියම ක්‍රමයකට පිළියෙළ කළ පසු මහපොළොවෙහි අවුල් වියවුල් ඇති නොකරනු. තවද බියබැතිමත් භාවයෙන්ද අභිලාෂයෙන්ද ඔහු (අල්ලාහ්) අයදිනු. නියත වශයෙන් අල්ලාහ්ගේ දයාලූභාවය යහකම් කරන්නවුන්ට සමීපය. (අඃරාෆ්:55/56)

මෙයට අදාල නබි වදනක් මෙසේ සඳහන් වේ:

අබුල් අබ්බාස් අබ්දුල්ලා බින් අබ්බාස් (රළි) මෙසේ වාර්තා

කළේය. ‘දිනක් රසූල් (සල්) තුමාණන් පිටු පසින් වාඩි වී සිටියෙමි. එවිට එතුමාණන් මා අමතා මෙසේ පැවසූහ.

දරුවා! ඔබට (උපදෙස්) වචන සමහරක් උගන්වන්නෙමි. අල්ලාහ් පිළිබඳ සිහි කල්පනාව ඔබ තුළ ආරක්ෂා කර ගන්න. එවිට අල්ලාහ් ඔබ ආරක්ෂා කරනු ඇත. අල්ලාහ් පිළිබඳ සිහි කල්පනාව ඔබ තුළ ආරක්ෂා කරගන්න, එවිට ඔබ ඉදිරියෙහි අල්ලාහ්ව දකිනු ඇත. ඔබ අයැද සිටිනා විට, අල්ලාහ්ගෙන් පමණක් අයදිනු. ඔබ පිහිට පතා ප්‍රාර්ථනා කරන විට අල්ලාහ්ගෙන් පමණක් පිහිට පතා ප්‍රාර්ථනා කරනු. දැන ගන්න. මුළු සමාජයම එක්වී ඔබට යහපතක් කිරීමට උත්සාහ කළද, අල්ලාහ් විසින් (ඔබට අදාළ ලේඛනයෙහි) යහපත් දේ පිළිබඳ ලියා ඇත්තේ කුමක්ද එම යහපත් දෑ හැර වෙනත් යහපතක් කිරීමට ඔවුන්හට නොහැක. ඔවුහු එක්රුැස් වී ඔබට අයහපතක් කිරීමට උත්සාහ කළද, අල්ලාහ් විසින් (ඔබට අදාළ ලේඛනයෙහි) අයහපත පිළිබඳ ලියා ඇත්තේ කුමක්ද ඒ අයහපත් දෑ හැර වෙනත් යමක් කිරීමට ඔවුන්ට නොහැක. (ඔබට අදාළ ලේඛනය ක්‍රියාවට නැංවීම පිණිස) පන්හිඳ ඔසවා ඇත. ලේඛන ගත වී ඇති පිටු සියල්ලක්ම වියළී ගොස් ඇත. (එනම් ඔබේ ඉරණම තීරණය කර අවසානයි.)”
මූලාශ්‍රය: අත් තිර්මිදි.

3

# සාධක අංක

උත්තරීතර අල්ලාහ් තම පාරිශුද්ධ අල්කුර්ආනයේ ඔහු හැර අන් අයෙකුට ආයාචනා කරන උදවීන් ආගමෙන් බැහැරව කටයුතු කරන අයවලුන් හා අල්ලාහ්ට ආදේශ කළ අයවලුන් බව පැහැදිලිව සඳහන් කර ඇත.ඒ බව මෙසේ සඳහන් වේ:

﴿ وَمَن يَدۡعُ مَعَ ٱللَّهِ إِلَٰهًا ءَاخَرَ لَا بُرۡهَٰنَ لَهُۥ بِهِۦ فَإِنَّمَا حِسَابُهُۥ عِندَ رَبِّهِۦٓۚ إِنَّهُۥ لَا يُفۡلِحُ ٱلۡكَٰفِرُونَ ﴾ [المؤمنون: ١١٧]

යමකු අල්ලාහ් සමග වෙනත් දෙවියකුට ආයාචනා කරයි නම්, ඒ සඳහා ඔහුට සාධකයක් නැත. ඔහුගේ විනිශ්චය ඔහුගේ රබ් (පරමාධිපති) ගේ සන්නිධානයෙහිය. ප්‍රතික්ෂේප කරන්නෝ ජය නොලබන්නෝය.

ඒ අනුව කවරෙකු හෝ අල්ලාහ්ට හැර වෙනත් අයෙකුට ආයාචනා කරන්නේ නම් ඔහු කාෆිර් වරයෙකු වන බව මෙම අල්කුර්ආන් වැකියෙන් පැහැදිලි වේ.

තවද පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

﴿ وَمَنۡ أَضَلُّ مِمَّن يَدۡعُواْ مِن دُونِ ٱللَّهِ مَن لَّا يَسۡتَجِيبُ لَهُۥٓ إِلَىٰ يَوۡمِ ٱلۡقِيَٰمَةِ وَهُمۡ عَن دُعَآئِهِمۡ غَٰفِلُونَ ۝٥ وَإِذَا حُشِرَ ٱلنَّاسُ كَانُواْ لَهُمۡ أَعۡدَآءٗ وَكَانُواْ بِعِبَادَتِهِمۡ كَٰفِرِينَ ﴾ [الأحقاف: ٥، ٦]

කියාමත් දින තෙක් තමන්ට පිළිතුරු නොදෙන, අල්ලාහ් නොවන අය කැඳවන්නාට වඩා ඉතා දුර් මාර්ගිකයා කවරෙක් ද? ඔවුහු තමන් කැඳවීම ගැන නොදැනුවත් ව සිටිති.තවද සකල මානව සංහතිය එකට එක්රැස් කරනු ලබන විට ඔවුහු (තමන්ට ආයාචනා කල) ඔවුනට සතුරු වෙති. තවද ඔවුන්ගේ ඇදහීම ප්‍රතික්ෂේප කරන්නන් වෙති. (අහ්කාෆ්: 5/6)

අල්ලාහ් නොවන අය කැඳවීමට වඩා දුර් මාර්ගිකයෙකු නොමැති බව මෙම අල්කුර්ආන් වැකියෙහි සර්ව බලධාරී අල්ලාහ් ඉතා පැහැදිලිව සඳහන් කරයි.

තවද එයට අදාලව අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

﴿قُلۡ إِنَّمَآ أَدۡعُواْ رَبِّي وَلَآ أُشۡرِكُ بِهِۦٓ أَحَدٗا﴾ [الجن:٢٠]

(ඔවුන්ට නබියේ!) ඔබ මෙසේ පවසනු: “මා ප්‍රාර්ථනා කර, ආරාධනා කරන්නේ, මගේ දෙවියන්වයි! ඔහුට කිසිවෙකුත් මා සමාන නොකරමි”. (අල්ජින්:20)

මෙම වැකියෙහි අර්ථ විවරණය නම්: මැවීම් අතුරින් කිසිවෙකුට හෝ ආයාචනා කිරීම මඟින් මා අල්ලාහ්ට ආදේශ නොකරමි යන්න වේ.

4

# සාධක අංක

විශ්වයේ තිබෙන ඕනෑම නිර්මාණයක් (ඒවාට කෙතරම් ගෞරවයක් හිමි වූවද) අල්ලාහ් ඒවාට පහසු කර දුන් විෂයන් හැර අන් කිසිවක් සිදු කිරීමට බලයක් නොමැති බව සර්ව බලධාරී අල්ලාහ් ඉතා පැහැදිලිව අල්කුර්ආනයේ සඳහන් කරයි.

ඒවා සියල්ල අල්ලාහ් වෙත අවශ්‍ය වන්නාහ.විශේෂයෙන් මිනිසුන් ගත් කළ සෑම මිනිසෙකුම එකහා සමාන වේ.සාමාන්‍ය මිනිසෙකුට තිබෙන සෑම අවශ්‍යතාවයක්ම උසස් ගෞරවයක් හිමි මිනිසෙකුටද ඇති වනු ඇත.ඔහු ආහාර පාන ගැනීමට අවශ්‍ය වේ.ඔහුට ලෙඩ රෝග ඇති වේ.ඔහුට මිය යෑමට සිදු වේ.මිනිසුන් කෙතරම් උසස් පදවියකට හිමිකම් කීවද ඔවුන් සියල්ල එකහා සමාන බව පාරිශුද්ධ අල්කුර්ආනයේ පහත ආකාරයෙන් සඳහන් වේ:

﴿يَا أَيُّهَا النَّاسُ أَنتُمُ الْفُقَرَاءُ إِلَى اللَّهِ وَاللَّهُ هُوَ الْغَنِيُّ الْحَمِيدُ﴾ [فاطر: ١٥]

ජනයිනි, නුඹලාය අල්ලාහ්වෙත යැපෙන්නෝ. තවද අල්ලාහ් ස්වයංපෝෂිතය. ස්වයන් ප්‍රසංශනීයය. (ෆාතිර්:15)

ධර්ම දූතයෙකු වන මූසා (අලෛ) තුමාණන් අල්ලාහ්ගෙන් ආයාචනා කළ ආකාරය අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

﴿فَقَالَ رَبِّ إِنِّي لِمَآ أَنزَلۡتَ إِلَيَّ مِنۡ خَيۡرٖ فَقِيرٞ﴾ [القصص: ٢٤]

මාගේ රබ්(පරමාධිපතියාණෙනී) ඔබ මා වෙත පහළ කරන කිසියම් යහපත් දෙයක් වේ නම් මම එය අවශ්‍ය කරන දිළින්දෙකු වෙමි යැයි ඔහු (මූසා) කීවේය. (අල්කසස්:24)

ඉබ්රාහීම් (අලෛ) තුමාණන්ගේ සම්භාෂණය පිළිබඳ පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

﴿وَإِذَا مَرِضۡتُ فَهُوَ يَشۡفِينِ﴾ [الشعراء: ٨٠]

තවද මා රෝගීවුවහොත් ඔහුය මට සුවය ලබා දෙන්නා. (අෂ්ෂුඅරා:80)

අල්ලාහ්ගේ ධර්ම දූතයෙකු වන ඊසා (අලෛ) තුමාණන් හා එතුමාණන්ගේ මව වන මර්යම් (අලෛ) තුමිය සෙසු මිනිසුන් මෙන් ආහාර අනුභව කළ බව මෙසේ අල්කුර්ආනයේ සඳහන් වේ:

﴿مَّا ٱلۡمَسِيحُ ٱبۡنُ مَرۡيَمَ إِلَّا رَسُولٞ قَدۡ خَلَتۡ مِن قَبۡلِهِ ٱلرُّسُلُ وَأُمُّهُۥ صِدِّيقَةٞۖ كَانَا يَأۡكُلَانِ ٱلطَّعَامَۗ ٱنظُرۡ كَيۡفَ نُبَيِّنُ لَهُمُ ٱلۡأٓيَٰتِ ثُمَّ ٱنظُرۡ أَنَّىٰ يُؤۡفَكُونَ﴾ [المائدة: ٧٥]

මර්යම්ගේ පුත් මසීහ් රසූල්(වක්තෘ)වරයකු මිස (වෙනත් කෙනකු) නොවීය. ඔහුට පෙරද (ඔහු වැනි බොහෝ) රසූල්වරු උකුත් වූහ. ඔහුගේ මවද සත්‍යශීලි තැනැත්තියකි. ඔවුන් දෙදෙනාම (සෙසු මිනිසුන් මෙන්) ආහාර අනුභව කළෝය. අපි (සත්‍ය පිළිබඳ) සංඥා (ආයාත්) ඔවුනට කෙසේ

පැහැදිලි කරන්නෙමු දැයි බලනු. පසුව ඔවුන් (එම සංඥාවන්-ආයාත්) විකෘති කරන සැටිද බලනු. (අල්මාඉදා:57)

තවද පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

﴿قُلْ فَمَن يَمْلِكُ مِنَ ٱللَّهِ شَيْـًٔا إِنْ أَرَادَ أَن يُهْلِكَ ٱلْمَسِيحَ ٱبْنَ مَرْيَمَ وَأُمَّهُۥ وَمَن فِى ٱلْأَرْضِ جَمِيعًا ۗ﴾ [المائدة: ١٧]

මර්යම්ගේ පුත් මසීහ්ද ඔහුගේ මවද මෙම මිහිතලය මත වෙසෙන සියල්ලන්ද විනාශ කර දැමීමට ඔහු(අල්ලාහ්)ට සිත්වූවා නම්, අල්ලාහ් එසේ කිරීමෙන් වැළැක්වීමට බලය ඇත්තේ කවරකුටදැයි (නබි මුහම්මද්) පවසනු. (අල්මාඉදා:17)

﴿وَمَآ أَرْسَلْنَا قَبْلَكَ مِنَ ٱلْمُرْسَلِينَ إِلَّآ إِنَّهُمْ لَيَأْكُلُونَ ٱلطَّعَامَ وَيَمْشُونَ فِى ٱلْأَسْوَاقِ﴾ [الفرقان: ٢٠]

නබි මුහම්මද්! නුඹට පෙර භෝජන අනුභව කරන හා වෙළෙඳ පොළවල්වල සැරිසරන අයවළුන් මිස රසූල්වරුන් ලෙස අපි නොඑව්වෙමු. (අල්කුර්ආන්:20)

﴿إِنَّكَ مَيِّتٌ وَإِنَّهُم مَّيِّتُونَ﴾ [الزمر: ٣٠]

(නබියේ!) නියත වශයෙන්ම ඔබත් මරණයට පත් විය හැකි අයෙකි. නියත වශයෙන්ම ඔවුන්ද මරණයට පත් විය හැකි අයයි. (අස්සුමර්:30)

﴿وَلَا تَقُولَنَّ لِشَا۟ىْءٍ إِنِّى فَاعِلٌ ذَٰلِكَ غَدًا ﴿٢٣﴾ إِلَّآ أَن يَشَآءَ ٱللَّهُ﴾ [الكهف: ٢٣]

කිසිම දෙයක් ගැන නියතවශයෙන් මම එය හෙට කරමියි, නොකියනු. අල්ලාහ්ගේ අභිමතයෙන් තොරව. (කහ්ෆ්:23/24)

﴿قُلْ إِنَّمَآ أَنَا۠ بَشَرٌ مِّثْلُكُمْ يُوحَىٰٓ إِلَيَّ أَنَّمَآ إِلَٰهُكُمْ إِلَٰهٌ وَٰحِدٌ فَمَن كَانَ يَرْجُواْ لِقَآءَ رَبِّهِۦ فَلْيَعْمَلْ عَمَلًا صَٰلِحًا وَلَا يُشْرِكْ بِعِبَادَةِ رَبِّهِۦٓ أَحَدًا﴾ [الكهف: ١١٠]

මා නුඹලා මෙන් මිනිසකු පමණි. නුඹලාගේ දෙවියා එකම දෙවියකු පමණක් බව මට හෙළි දරව් කරනු ලැබ ඇත. එම නිසා තම රබ්(පරමාධිපති) මුණ ගැසීමට බලාපොරොත්තු වන අය දැහැමි ක්‍රියාවන් කළ යුතුය. තවද තම රබ්(පරමාධිපති) නැමදීමේදී කිසිවකු ආදේශ නොකළ යුතු යැයි (නබි මුහම්මද්) පවසනු. (කහ්ෆ්:110)

එපමණක් නොව ඇතැම් සමූහයන් තමන් වෙත එවන ලැබූ ධර්ම දූතයින්ව ඝාතනය කොට ඇත.මෙයින් පෙනී යන්නේ එම ධර්ම දූතයින් කෙතරම් ගෞරවයක් ඔවුනට හිමි වූවද කිසිදා මනුෂ්‍ය ස්වභාවයෙන් ඔවුහු බැහැරව නොයති යන්න වේ. ඇතැම් සමූහයන් ධර්ම දූතයින්ව ඝාතනය කළ බව තහවුරු කරමින් අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

﴿أَفَكُلَّمَا جَآءَكُمْ رَسُولٌۢ بِمَا لَا تَهْوَىٰٓ أَنفُسُكُمُ ٱسْتَكْبَرْتُمْ فَفَرِيقًا كَذَّبْتُمْ وَفَرِيقًا تَقْتُلُونَ﴾ [البقرة: ٨٧]

(නමුත් අපගේ)ධර්ම දූතයෙකු නුඹලාට අකමැති වන දේ ගෙනෙන සෑම විටකම නුඹලා අහංකාර වූවෙහුය. නුඹලා (ධර්ම දූතයින්) පිරිසක් බොරු කළ අතර තවත් පිරිසක් ඝාතනය කළාහුය. (අල්බකරා:87)

කෙටියෙන් කිව හොත්, දුආ හෙවත් ආයාචනාව කළ යුත්තේ අල්ලාහ්ගෙන් පමණි.මන්දයත් විෂයන් සියල්ල කෙරෙහි

ශක්තිය ඇති බලවත් පරිපෝෂිකයා ඔහු වේ.ඒ පිළිබඳ අල්ලාහ් මෙසේ පවසයි:

﴿ إِنَّ ٱلَّذِينَ تَدۡعُونَ مِن دُونِ ٱللَّهِ عِبَادٌ أَمۡثَالُكُمۡۖ فَٱدۡعُوهُمۡ فَلۡيَسۡتَجِيبُواْ لَكُمۡ إِن كُنتُمۡ صَٰدِقِينَ ﴾ [الأعراف: ١٩٤]

අල්ලාහ් හැර නුඹලා (කැඳවන) ප්‍රාර්ථනා කරන අය නියතවශයෙන්ම නුඹලා වැනි ගැත්තෝය. එමනිසා නුඹලා ඔවුන්(කැඳවන්නන්)ට ප්‍රාර්ථනා කර බලනු. නුඹලා (ඔවුන් පිළිබඳ තබා ඇති විශ්වාසය) සත්‍යය නම් ඔවුන් නුඹලා(ගේ ප්‍රාර්ථනාවන්)ට පිළිතුරු දෙනු ඇත. (අල්අඃරාෆ්:194)

﴿يَٰٓأَيُّهَا ٱلنَّاسُ ضُرِبَ مَثَلٞ فَٱسۡتَمِعُواْ لَهُۥٓۚ إِنَّ ٱلَّذِينَ تَدۡعُونَ مِن دُونِ ٱللَّهِ لَن يَخۡلُقُواْ ذُبَابٗا وَلَوِ ٱجۡتَمَعُواْ لَهُۥۖ وَإِن يَسۡلُبۡهُمُ ٱلذُّبَابُ شَيۡـٔٗا لَّا يَسۡتَنقِذُوهُ مِنۡهُۚ ضَعُفَ ٱلطَّالِبُ وَٱلۡمَطۡلُوبُ ﴾ [الحج: ٧٣]

මිනිසුනි, නුඹලාට උපමාවක් ප්‍රකාශ කරනු ලැබේ. එබැවින් එයට සවන් දෙන්න. නුඹලා අල්ලාහ් හැර කවරෙකු කැඳවන්නෙහු ද ඔවුහු සියල්ලෝ ම එක් රැස් වූවත් මැස්සකුවත් නිර්මාණය නොකරති. මැස්සා ඔවුන්ගෙන් යමක් පැහැර ගත්තේ නම් උගෙන් එය මුදවා ගැනීමටවත් ඔවුනට නොහැකිය. සොයන්නා ද සොයනු ලබන්නා ද දුබල ව සිටිති. (හජ්:73)

සැබෑ මූඃමින්වරයෙකුගේ ගුණාංගයන් පිළිබඳ අල්ලාහ් පවසන විට ඔවුන් පහත සඳහන් ආකාරයෙන් ඔහුගෙන් ආයාචනා කරන බව සඳහන් කරයි.

﴿وَٱلَّذِينَ يَقُولُونَ رَبَّنَا ٱصۡرِفۡ عَنَّا عَذَابَ جَهَنَّمَۖ إِنَّ عَذَابَهَا كَانَ غَرَامًا﴾

[الفرقان: ٦٥]

තවද ඔවුන් “අපගේ දෙවියනේ! නිරයේ වේදනාව අපගෙන් ඔබ වළක්වා හරිනු මැනව! මන්දයත් එහි වේදනාව නම්, නියත වශයෙන්ම ස්ථිර වූ දුක් කරදරයක් වන්නේය” යයි ප්‍රාර්ථනා කරමින්ම සිටිනු ඇත. (ෆුර්කාන්:65)

## 5

# සාධක අංක

**උත්තරීතර අල්ලාහ් ගෞරවණීය ධර්ම දූතයින් ,ඔහුගේ වහල්ලන් අතුරින් සත් පුරුෂයින් හා මලාඉකාවරුන් යනාදී අයවලුන් ඔවුනොවුන්ගේ ජීවිතයේ විවිධ කටුක අවස්ථාවන් වලදී අල්ලාහ් හැර අන් අයෙකුගෙන් ආයාචනා නොකළ බව පවසා ඇත.ඒ අනුව අපගේ යුතුකම වන්නේ ඔවුන්ව අනුගමනය කිරීමයි.**

විවිධ ධර්ම දූතයින් ඔවුන්ගේ කටුක අවස්ථාවල කටයුතු කළේ කෙසේද යන්න පිළිබඳ පහත අල්කුර්ආන් වැකි වලින් පැහැදිලි කරනු ලබයි.

ඒ අනුව මත්සයකුගේ උදරය තුල යූනුස් (අලෛ) සිරවී සිටි අවස්ථාවේදී ප්‍රාර්ථනා කළ ආකාරය අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

﴿ وَذَا ٱلنُّونِ إِذ ذَّهَبَ مُغَٰضِبًا فَظَنَّ أَن لَّن نَّقۡدِرَ عَلَيۡهِ فَنَادَىٰ فِي ٱلظُّلُمَٰتِ أَن لَّآ إِلَٰهَ إِلَّآ أَنتَ سُبۡحَٰنَكَ إِنِّي كُنتُ مِنَ ٱلظَّٰلِمِينَ ﴾ [الأنبياء: ٨٧، ٨٨]

තවද මත්සය හිමියා (සිහිපත් කරනු) ඔහු කෝපාවිශ්ටව ගිය කල්හී (දඬුවමින් හසුකර ගැනීමට) අපට ශක්තියක් නැතැයි ඔහු සිතුවේය. (එහෙත් අල්ලාහ් ඔහු හසුකරගත්) පසුව අඳුරේ සිට ඔහු ඔබ හැර වෙනත් දෙවියකු නැත. ඔබ

සුවිශුද්ධය. නියතවශයෙන් මම අපරාධකරුවන්ගෙන් කෙනෙක් වීමියි (අඬ ගැසුවේය) .එවිට අපි ඔහු(ගේ දුආව) ට පිළිතුරු දුනිමු. තවද විපතින් ඔහු ගලවා ගතිමු. එලෙසය, විශ්වාසිකයින් අප මුදවන්නේ. (අන්බියා: 77/78)

Zසකරියියා (අලෛ) තුමාණන් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ ආකාරය මෙසේ අල්කුර්ආනයේ සඳහන් වේ:

﴿وَزَكَرِيَّآ إِذۡ نَادَىٰ رَبَّهُۥ رَبِّ لَا تَذَرۡنِي فَرۡدٗا وَأَنتَ خَيۡرُ ٱلۡوَٰرِثِينَ ﴿٨٩﴾ فَٱسۡتَجَبۡنَا لَهُۥ وَوَهَبۡنَا لَهُۥ يَحۡيَىٰ وَأَصۡلَحۡنَا لَهُۥ زَوۡجَهُۥٓۚ إِنَّهُمۡ كَانُواْ يُسَٰرِعُونَ فِي ٱلۡخَيۡرَٰتِ وَيَدۡعُونَنَا رَغَبٗا وَرَهَبٗاۖ وَكَانُواْ لَنَا خَٰشِعِينَ﴾

[الأنبياء: ٨٩ – ٩٠]

“මාගේ දෙවියනි, මා තනි පුද්ගලයෙකු ලෙස අත් නොහරිනු මැනව ! ඔබ උරුමක්කරුවන්ගෙන් අති විශිෂ්ට යැ” යි සකරිය්යා තම දෙවියන් කැඳවූ විට ඔහු(ගේ ප්‍රාර්ථනාව)ට පිළිතුරු දුනිමු. ඔහුට යහ්යා තිළිණ කළෙමු. ඔහුගේ භාර්යාව ද ඔහු වෙනුවෙන් (දරුවෙකු පිළිසිඳ ගත හැකි) යහපත් තත්ත්වයකට පත් කළෙමු. ඔවුහු යහපත් ක්‍රියාවන්හි ඉක්මන් වන්නෝ ද උද්‍යෝගයෙන් හා බියෙන් යුතුව අප වෙත ප්‍රාර්ථනා කරන්නෝ ද වූහ. අපට යටහත් පහත් වන්නෝ ද වූහ. (අන්බියා: 89/90)

අයියූබ් (අලෛ) තුමාණන් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ ආකාරය මෙසේ අල්කුර්ආනයේ සඳහන් වේ:

﴿وَأَيُّوبَ إِذۡ نَادَىٰ رَبَّهُۥٓ أَنِّي مَسَّنِيَ ٱلضُّرُّ وَأَنتَ أَرۡحَمُ ٱلرَّٰحِمِينَ ﴿٨٣﴾ فَٱسۡتَجَبۡنَا

لَهُۥ فَكَشَفْنَا مَا بِهِۦ مِن ضُرٍّ ۖ وَءَاتَيْنَٰهُ أَهْلَهُۥ وَمِثْلَهُم مَّعَهُمْ رَحْمَةً مِّنْ عِندِنَا وَذِكْرَىٰ لِلْعَٰبِدِينَ ﴾ [الأنبياء: ٨٣، ٨٤]

“දැඩි වේදනාව මා ග්‍රහණය කර ඇත. ඔබ කරුණාවන්තයින්ගෙන් අති මහත් කරුණාවන්තයා යැ”යි අය්යූබ් තම දෙවියන් කැඳවූ විට අපි ඔහු(ගේ ප්‍රාර්ථනාව)ට පිළිතුරු දුනිමු. ඔහුට හටගත් දැඩි වේදනාව පහ කළෙමු. ඔහුගේ පවුලේ අය ද ඔවුන් සමඟ එවැන්නන් ද අපගේ දයාවක් ලෙස ඔහුට පිරිනැමුවෙමු. මෙය නැමදුම් කරන්නන්ට උපදේශයකි. (අන්බියා: 83/84)

ගෞරවණීය මලාඉකාවරුන් පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කර ඇත:

﴿ٱلَّذِينَ يَحْمِلُونَ ٱلْعَرْشَ وَمَنْ حَوْلَهُۥ يُسَبِّحُونَ بِحَمْدِ رَبِّهِمْ وَيُؤْمِنُونَ بِهِۦ وَيَسْتَغْفِرُونَ لِلَّذِينَ ءَامَنُوا۟ رَبَّنَا وَسِعْتَ كُلَّ شَىْءٍ رَّحْمَةً وَعِلْمًا فَٱغْفِرْ لِلَّذِينَ تَابُوا۟ وَٱتَّبَعُوا۟ سَبِيلَكَ وَقِهِمْ عَذَابَ ٱلْجَحِيمِ ۝٧ رَبَّنَا وَأَدْخِلْهُمْ جَنَّٰتِ عَدْنٍ ٱلَّتِى وَعَدتَّهُمْ وَمَن صَلَحَ مِنْ ءَابَآئِهِمْ وَأَزْوَٰجِهِمْ وَذُرِّيَّٰتِهِمْ ۚ إِنَّكَ أَنتَ ٱلْعَزِيزُ ٱلْحَكِيمُ ﴾ [غافر: ٧، ٨]

අර්ෂය උසුලන අය ද ඒ වටා සිටින අය ද තම දෙවියන්ගේ ප්‍රශංසාව සුවිශුද්ධ කරති. ඔහු ගැන විශ්වාස කරති. “අපගේ දෙවියනි, ඔබ දයාවෙන් හා දැනුමෙන් සියලු දේ වටලා සිටින්නෙහි ය. එබැවින් ක්ෂමාව ඉල්ලා ඔබේ මාර්ගය අනුගමනය කළ අය ක්ෂමා කරනු මැනව! නිරයේ වේදනාවෙන් ඔවුන් ආරක්ෂා කරනු මැනවැ” යි විශ්වාස කළ අය වෙනුවෙන් පාප ක්ෂමාව අයැදිති. “අපගේ දෙවියනි!, ඔවුන් ද ඔවුන්ගේ දෙමාපියන් ද ඔවුන්ගේ ජීවන

සහකාරියන් ද ඔවුන්ගේ දරුවන් අතුරින් සත් පුරුෂයින් ද ඔබ පොරොන්දු වූ සදාතනික ස්වර්ගයන්හි ඇතුල් කරනු මැනව. ඔබ අබිබවන්නා යත ප්‍රඥාවන්තයා ය. (ගාෆිර්: 7/8)

බද්ර් සටන අතරවාරයේදී නබි මුහම්මද් (සල්) තුමාණන් පහත ආකාරයෙන් අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ බව ඉබ්නු අබ්බාස් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

අහෝ දෙවිඳුනි! නුඹත් සමඟ ඇති කර ගත් ගිවිසුම හා නුඹට දුන් පොරොන්දුව ඉදිරිපත් කරමින් මා නුඹෙන් ආයාචනා කර සිටින්නෙමි. අහෝ දෙවිඳුනි! නුඹගේ සේනාව පරාජ වුවහොත් නුඹව වන්දනාමාන කිරීමට කිසිවෙකුවත් නොමැති වනු ඇත....

මේ ආකාරයෙන් නබි (සල්) තුමාණන් දැඩි ලෙස බැගෑපත්ව අල්ලාහ් ඉදිරියේ ප්‍රාර්ථනා කරමින් සිටියදී අබූ බක්ර් (රළි) තුමාණන් අහෝ නබි තුමණී ප්‍රමාණවත් වේ යනුවෙන් පැවසූ පසු (මේ පිරිස පරාජය කරනු ලබති. ඔවුහු පිටු පා පලා යති) යන අල්කුර්ආන් වැකිය පාරායනය කරමින් නබි (සල්) තුමාණන් එම ස්ථානයෙන් පිටවී ගියේය.

ඉබ්නු මස්ඌද් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි: බද්ර් දිනයේදී නබි (සල්) තුමාණන් අල්ලාහ්ගෙන් බැගෑපත්ව ප්‍රාර්ථනා කළ ආකාරයට වඩා වැඩියෙන් අන් කිසිවෙක් ප්‍රාර්ථනා කිරීම වෙත අප සවන්දී නොමැත. (මූලාශ්‍රය: අත් තබරානී)

6

# සාධක අංක

විශ්වය හා එහි ඇති සියළු දෑ අල්ලාහ්ට අයත් වේ.ඒවා සියල්ල ඔහුගේ අත් වසමෙහි හා ඔහුගේ කළමනාකරණය යටතේ පසුවන්නේය. එසේනම් ප්‍රාර්ථනා කළ යුත්තේ ඔහුගෙන් පමණි.මන්දයත් විශ්ව පාලනය හා විශ්ව නිර්මාණයන් හි ආධිපත්‍ය තිබෙන්නේ ඔහු සතුවය.

අල්ලාහ් තආලා මෙසේ පවසයි:

﴿ٱلرَّحۡمَٰنُ عَلَى ٱلۡعَرۡشِ ٱسۡتَوَىٰ ٥ لَهُۥ مَا فِي ٱلسَّمَٰوَٰتِ وَمَا فِي ٱلۡأَرۡضِ وَمَا بَيۡنَهُمَا وَمَا تَحۡتَ ٱلثَّرَىٰ﴾ [طه: ٥، ٦]

අසීමිත කරුණාවන්තයා අර්ෂ් මත අසුන් ගත්තේ ය. අහස්හි තිබෙන දැය ද පොළොවෙහි තිබෙන දැය ද ඒ දෙක අතර තිබෙන දැය ද පොළොව යට තිබෙන දැය ද ඔහුට ම හිමිය. (තාහා:5/6)

﴿يَعۡلَمُ مَا يَلِجُ فِي ٱلۡأَرۡضِ وَمَا يَخۡرُجُ مِنۡهَا وَمَا يَنزِلُ مِنَ ٱلسَّمَآءِ وَمَا يَعۡرُجُ فِيهَاۖ وَهُوَ مَعَكُمۡ أَيۡنَ مَا كُنتُمۡۚ وَٱللَّهُ بِمَا تَعۡمَلُونَ بَصِيرٞ﴾ [الحديد: ٤]

අහස් ද පොළොව ද දින හයකින් නිර්මාණය කළේ ඔහු ය. පසුව අර්ෂ්හි අසුන් ගත්තේ ය. පොළොවෙහි ඇතුළු වන දැයත් එයින් බැහැර වන දැයත් අහසින් පහළ වන දැයත්

එහි නැග යන දැයත් ඔහු දනියි. නුඹලා කොහි සිටියත් ඔහු නුඹලා සමඟ සිටියි. අල්ලාහ් නුඹලා කරන දේ බලන්නෙකි. (හදීද්:4)

තවද අල්ලාහ් මෙසේ පවසයි:

﴿إِن تَدْعُوهُمْ لَا يَسْمَعُوا۟ دُعَآءَكُمْ وَلَوْ سَمِعُوا۟ مَا ٱسْتَجَابُوا۟ لَكُمْ ۖ وَيَوْمَ ٱلْقِيَـٰمَةِ يَكْفُرُونَ بِشِرْكِكُمْ ۚ وَلَا يُنَبِّئُكَ مِثْلُ خَبِيرٍ﴾ [فاطر: ١٤]

නුඹලා ඔවුන් කැඳවුවහොත් නුඹලාගේ කැඳවීමට ඔවුහු සවන් නොදෙති. සවන් දෙයි කියා තිකමට සිතුවත් නුඹලාට පිළිතුරු නොදෙති. කියාමත් දින නුඹලා සමානයන් කල්පනය කිරීම ඔවුහු ප්‍රතික්ෂේප කරති. ප්‍රවීණ (දෙවි)යා මෙන් ඔබට කිසිවෙක් දැන්විය නොහැකිය. (ෆාතිර්:14)

තවද අල්ලාහ් මෙසේ පවසයි:

﴿ٱللَّهُ ٱلصَّمَدُ﴾ [الإخلاص: ٤]

අල්ලාහ් අවශ්‍යතා වලින් තොර කෙනෙකි. (ඉඛ්ලාස්:1-4)

අල්ලාහ් අවශ්‍යතා වලින් තොර වූ කෙනෙකු යන අර්ථකතනයෙන් පෙනී යන්නේ විශ්ව නිර්මාණ සියල්ල ඒවායෙහි අවශ්‍යතාවයන් සපුරා ගැනීම පිණිස අල්ලාහ් වෙත අවශ්‍ය වන බවයි.

7

# සාධක අංක

සර්ව බලධාරී අල්ලාහ් ඇතැම් අවස්ථාවන් වලදී ඔහුගේ ධර්ම දූතයින් ඔහුගෙන් යම් දෙයක් ප්‍රාර්ථනා කළද ඔවුන් ප්‍රාර්ථනා කළ දෑ ඉටු කර නොදුන් බව හා ඒවාට පිළිතුරු නොදුන් බව අල්කුර්ආනයේ පවසා ඇත.ඒවායින් සමහරක් පහත දැක්වේ:

නබි (සල්) තුමාණන් තම පියාගේ සහෝදරයා වන අබූ තාලිබ් දිව්‍යමය සත්‍ය පිළිගැනීම උදෙසා තැත් කළද එතුමාගේ උත්සහය අසාර්තක වූහ.එවිට පහළ වූ අල්කුර්ආන් වැකිය පහත ආකාරයෙනි:

﴿إِنَّكَ لَا تَهۡدِي مَنۡ أَحۡبَبۡتَ وَلَٰكِنَّ ٱللَّهَ يَهۡدِي مَن يَشَآءُۚ وَهُوَ أَعۡلَمُ بِٱلۡمُهۡتَدِينَ﴾

[القصص: ٥٦]

(මුහම්මද්,) ඔබ ප්‍රිය කරන කෙනෙකු යහ මග වෙත යොමු කිරීමට ඔබට නොහැකිය. අල්ලාහ් තමා සිතූ කෙනෙකුට යහ මග පෙන්වයි. ඔහු යහ මග ලත් අය ගැන මැනවින් දනියි. (කසස්:56)

තවද මෙසේ පවසයි:

﴿ٱسۡتَغۡفِرۡ لَهُمۡ أَوۡ لَا تَسۡتَغۡفِرۡ لَهُمۡ إِن تَسۡتَغۡفِرۡ لَهُمۡ سَبۡعِينَ مَرَّةٗ فَلَن يَغۡفِرَ ٱللَّهُ لَهُمۡ﴾

[التوبة: ٨٠]

(මුහම්මද්,) ඔබ ඔවුන් වෙනුවෙන් පාප ක්ෂමාව අයැදින්න. නැතහොත් නොඅයැද සිටින්න. ඔබ ඔවුන් වෙනුවෙන් හැත්තෑ වරක් පාප ක්ෂමාව අයැදුවත් අල්ලාහ් ඔවුනට කිසිසේත් ම ක්ෂමාව නොදෙයි. මෙයට හේතුව ඔවුන් අල්ලාහ් ද ඔහුගේ දූතයා ද ප්‍රතික්ෂේප කිරීමයි. අල්ලාහ් වැරදි කරන පිරිසට යහ මග නොපෙන්වයි. (තව්බා:80)

තවද මෙසේ පවසයි:

﴿مَا كَانَ لِلنَّبِيِّ وَٱلَّذِينَ ءَامَنُوٓاْ أَن يَسۡتَغۡفِرُواْ لِلۡمُشۡرِكِينَ وَلَوۡ كَانُوٓاْ أُوْلِي قُرۡبَىٰ مِنۢ بَعۡدِ مَا تَبَيَّنَ لَهُمۡ أَنَّهُمۡ أَصۡحَٰبُ ٱلۡجَحِيمِ﴾ [التوبة: ١١٣]

සමානයන් කල්පනය කරන්නෝ නිරා වාසීහු යැයි දැනගත් පසුව ඔවුන් කිට්ටු ඥාතීන් වූවත් ඔවුන් වෙනුවෙන් පාප ක්ෂමාව අයැදීම විශ්වාස කළ අයට ද මෙම නබිවරයා (මුහම්මද්)ට ද යුතු නැත. (තව්බා:113)

නබි ඉබ්රාහීම් (අලෛ) තුමාණන් තම පියාණන් සඳහා කළ පාපොච්ඡාරණය අල්ලාහ් පිළි නොගත් බව අල්කුර්ආනයේ මෙසේ සඳහන් වී ඇත.

﴿وَمَا كَانَ ٱسۡتِغۡفَارُ إِبۡرَٰهِيمَ لِأَبِيهِ إِلَّا عَن مَّوۡعِدَةٖ وَعَدَهَآ إِيَّاهُ فَلَمَّا تَبَيَّنَ لَهُۥٓ أَنَّهُۥ عَدُوّٞ لِّلَّهِ تَبَرَّأَ مِنۡهُۚ إِنَّ إِبۡرَٰهِيمَ لَأَوَّٰهٌ حَلِيمٞ﴾ [التوبة: ١١٤]

ඉබ්‍රාහීම් තම පියා වෙනුවෙන් පාප ක්ෂමාව අයැද සිටියේ ඔහු තම පියාට දුන් පොරොන්දුවක් හේතු කොටගෙන ය. ඔහු අල්ලාහ්ට සතුරෙක් බව දැනගත් පසු ඔහු එයින් වැළකීය. ඉබ්‍රාහීම් නිහතමානී කෙනෙකි, ඉවසිලිවන්තයෙකි. (තව්බා:114)

නබි නූහ් (අලෛ) තුමාණන් පිළිබඳ අල්ලාහ් මෙසේ පවසයි:

﴿وَنَادَىٰ نُوحٞ رَّبَّهُۥ فَقَالَ رَبِّ إِنَّ ٱبۡنِي مِنۡ أَهۡلِي وَإِنَّ وَعۡدَكَ ٱلۡحَقُّ وَأَنتَ أَحۡكَمُ ٱلۡحَٰكِمِينَ ٤٥ قَالَ يَٰنُوحُ إِنَّهُۥ لَيۡسَ مِنۡ أَهۡلِكَۖ إِنَّهُۥ عَمَلٌ غَيۡرُ صَٰلِحٖۖ فَلَا تَسۡـَٔلۡنِ مَا لَيۡسَ لَكَ بِهِۦ عِلۡمٌۖ إِنِّيٓ أَعِظُكَ أَن تَكُونَ مِنَ ٱلۡجَٰهِلِينَ ٤٦ قَالَ رَبِّ إِنِّيٓ أَعُوذُ بِكَ أَنۡ أَسۡـَٔلَكَ مَا لَيۡسَ لِي بِهِۦ عِلۡمٞۖ وَإِلَّا تَغۡفِرۡ لِي وَتَرۡحَمۡنِيٓ أَكُن مِّنَ ٱلۡخَٰسِرِينَ﴾ [هود: ٤٥-٤٧]

නූහ් තම දෙවියන් කැඳවීය. මාගේ දෙවියනි, "මාගේ පුත්‍රයා මාගේ පවුලේ කෙනෙකි. ඔබේ පොරොන්දුවත් සැබෑය. ඔබ විනිශ්චයකරුවන්ගෙන් අති විශිෂ්ට යැ"යි ඔහු පැවසීය.

"නූහ්, ඔහු ඔබේ පවුලේ කෙනෙක් නොවේ. මෙය යහපත් ක්‍රියාවක් නොවේ. ඔබට දැනුමක් නොමැති දෙයක් ගැන මාගෙන් නොඅසන්න. ඔබ අඥානයින්ගෙන් කෙනෙක් නොවන මෙන් මම ඔබට අනුශාසනා කරමි"යි ඔහු පැවසීය.

"දෙවියනි, මට දැනුමක් නොමැති දෙයක් ගැන ඔබ වෙත ඇසීම කෙරෙන් ඔබෙන් ආරක්ෂාව පතමි. ඔබ මට ක්ෂමා කර දයාව නොදැක්වුවහොත් මම අලාභ ලද්දන්ගෙන් කෙනෙක් වෙමි" යි ඔහු පැවසීය. (හූද්:45-47)

එසේ නම් අල්ලාහ් හැර අන් අයෙකුගෙන් ප්‍රාර්ථනා කළ හැක්කේ කෙසේද යන්න මෙයින් පැහැදිලි වේ.

තවද පහත සඳහන් වන සිදුවීම් දෙස මදක් යොමු වන්න.

- උහද් සටනේදී මුෂ්රික්වරුන්ට (දේව ආදේශකයින්) එරෙහිව මුස්ලිම්වරුන් විසින් සටන් කරනු ලැබුවේ නබි (සල්) තුමාණන්ගේ නායකත්වයෙනි.මුස්ලිම්වරුන් එම

සටනේදී ඔවුන් සතුව තිබෙන භෞතික සාධක සියල්ල වැය කරමින් අල්ලාහ්ගේ සහය බලාපොරොත්තු වූවද එම සහය නිසි ආකාරව නොලැබුණි. එම සටනේදී සිදු වූ දුෂ්කරතාවයන්, මුස්ලිම්වරුන් සියල්ල සඳහා එක් ආදර්ශයක් හා මඟ පෙන්වීමක් ලෙස ආලුඉම්රාන් පරිච්ඡේදයේ අල්කුර්ආන් වැකි රාශියක් අල්ලාහ් විසින් පහළ කරන ලදී.

- අලි බින් අබී තාලිබ් (රළි) තුමාණන් සිෆ්ෆීන් යුද්ධයේදී තම සතුරු සේනාව පරාජය කිරීම සඳහා තමා සතුව තිබෙන සාධක සියල්ල වැය කළද තම අධිෂ්ඨානය කරා පා තැබීමට එතුමාණන් හට අපොහොසත් වූණි.
- හුසයින් (රළි) තුමාණන් තම ආත්මය රැක ගැනීම සඳහා කෙතරම් ක්‍රියාශීලීව සටන් කළද අවසානයේ එතුමා හා ඔහුගේ ඥාතීන් පිරිසක් ඝාතනය කිරීමට ලක් වූණි.තමා හා තමාගේ සිය පවුලේ ඥාතීන්ව ආරක්ෂා කිරීමට ඔහුට අපොහොසත් වූණි.

අල්ලාහ් හැර අලි හා හුසයින් (රළි) යනාදී පිරිසගෙන් දුආ ප්‍රාර්ථනා කරන උදවීන් මදක් සිතා බැලිය යුත්තේ සිය ආත්මය ආරක්ෂා කිරීමටවත් හැකියාවක් නොතිබුණු තවද අල්ලාහ්ගේ දෛවය ප්‍රතික්ෂේප කිරීමටද නොහැකි වූණු එම පිරිසගෙන් දුආ ප්‍රාර්ථනා කළ හැක්කේ කෙසේද යන්නයි.

අල්ලාහ්ගෙන් පමණක් දුආ ප්‍රාර්ථනා කළ යුතුයි යන මෙම

යථාර්ථය සියලු මනුෂ්‍යයින් විසින් අවබෝධ කළ හැකි තවද ප්‍රතික්ෂේප කිරීමට නොහැකි බුද්ධි ගෝචරයට එකඟ වන කරුණකි.

අලි හා හුසයින් (රළි) වැනි උදවීන් ඔවුනට මුහුණ පෑමට සිදු වූ කටුක අවස්ථාවන්හිදී ඔවුන්ගේ පරමාධිපති වන අල්ලාහ් වෙත අවධානය යොමු කර ඔහුගෙන්ම ප්‍රාර්ථනා කළෝය.ඒ අනුව ඔවුන්ව ආදරය කරන්නෙමු යනුවෙන් පුරසාරම් දෙඩවන උදවීන්ගේ යුතුකම වන්නේද ඔවුන් කටුක අවස්ථාවන්හිදී අනුගමනය කළ ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම වේ.

මෙම ක්‍රියාවලිය සාමාන්‍ය මිනිසුන් අතර කෙතරම් ව්‍යාප්ත වි ඇත්ද කිව හොත් කෙනෙකු කඃබාවට අසලින් පැමිණ එහිදී (යා අලී) අහෝ අලි යැයි කෑඳව්වේය.මෙය ඇසූ එතැන් සිටි විද්වතකු නුඹ කෙනෙකුගේ නිවසක් තුල සිටින විට යම් දෙයක් අවශ්‍ය වූ කල්හි නුඹ එනිවසට අසලින් වෙසෙන අසල්වැසියාගෙන් අසන්නේද නැතහොත් එකී ගෙහිමියාගෙන් අසන්නේද යැයි විමසා සිටියහ.එවිට සැනින් ඔහු පිළිතුරු දුන්නේ එකී ගෙහිමියාගෙන් මා අසමි යනුවෙනි.

මෙම සිදුවීමෙහි සලකා බැලිය යුතු කරුණ වන්නේ ඔහුට යථාර්ථය ප්‍රතික්ෂේප කිරීමට නොහැකි වී එය පිළිගැනීමට සිදු වුණු බවයි.

එබැවින් පහත අල්කුර්ආන් වැකියෙහි අල්ලාහ් මෙසේ පවසයි:

﴿ أُوْلَٰٓئِكَ ٱلَّذِينَ يَدۡعُونَ يَبۡتَغُونَ إِلَىٰ رَبِّهِمُ ٱلۡوَسِيلَةَ أَيُّهُمۡ أَقۡرَبُ وَيَرۡجُونَ رَحۡمَتَهُۥ وَيَخَافُونَ عَذَابَهُۥٓۚ إِنَّ عَذَابَ رَبِّكَ كَانَ مَحۡذُورٗا ﴾ [الإسراء: ٥٧]

ඔවුන් අයැදින අයම, ඔවුන්ගෙන් කවරකු තමන්ගේ රබ් (පරමාධිපති) වෙත ඉතා සමීප විය හැකිදැයි විධි සොයති. තවද ඔවුන් ඔහුගේ දයාව අපේක්ෂා කරති. ඔහුගේ දඬුවමටද බියවෙති. නියතවශයෙන් නුඹගේ රබ් (පරමාධිපති) ගේ දඬුවම බියවිය යුතු දෙයකි. (ඉස්රා:57)

අවබෝධ කිරීම පිණිස සරල උදාහරණයක් පහතින් දැක්වේ:

අල්ලාහ් තආලා කෙනෙකුට ධන සම්පත් රාශියක් ලබා දී ඔහුව ධනවතෙකු බවට පත් කර ඔහුට දූ දරුවන්ද ලබා දී ඇත.එම පුද්ගලයා සැම විට තම දූ දරුවන් හට පවසා සිටියේ මිලමුදල්,ආහාරපාන,ඇඳුම් පැළඳුම් යනාදී දේවල් අවශ්‍ය වූ කලි ඒවා ඔහුගෙන් විමසා සිටින ලෙසයි.මෙම අවස්ථාවේදී එම දූදරුවන් සිය පියාගෙන් තම අවශ්‍යතාවයන් නොවිමසා අසල්වැසියෙකුගෙන් ඒවා විමසා සිටියේ නම් මෙම ක්‍රියා මාර්ගය බුද්ධි ගෝචරයට එකඟ වූවක් වේද නැතහොත් බුද්ධි ගෝචරයට පටහැනි වූවක් වේද? නියත වශයෙන්ම මෙය බුද්ධි ගෝචරයට පටහැනි ක්‍රියාවලියකි යන්න ඉතා පැහැදිලිය.

මේ ආකාරයෙන් දෙවියෙකු නොවන සාමාන්‍ය මිනිසෙකුගේ විෂයක් තුලම බුද්ධි ගෝචරයට පටහැනි වූවක් යැයි අපට අවබෝධ කළ හැකි නම් සර්ව බලධාරී අල්ලාහ්ගේ විෂයෙහි කෙතරම් බැරෑරුම්ද යන්න මදක් සිතා බැලිය යුතුයි.

ඒ අනුව මිනිසෙකුගේ යුතුකම වන්නේ තම නිර්මාපකයා හා තම පාලකයා වන තම දුක්කරදර හා උවදුරු ඉවතලන අල්ලාහ් වෙත පමණක් අවධානය යොමු කිරීම වේ.

ඇතැමුන් ධර්ම දූතයින් පෙන් වූ ප්‍රාතිහාර්යයන් ගෙන හැර දක්වමින් අල්ලාහ් හැර අන් අයෙකුගෙන් දුආ ප්‍රාර්ථනා කළ හැකි යැයි වාද කරති.ඒ සඳහා මූසා (අලෛ) තුමා ගල් පර්වතකට පහර දුන් සැනින් එයින් ජලය පිට වීම හා ඊසා (අලෛ) තුමා මිය ගිය පුද්ගලයින් සඳහා නැවත වරක් ප්‍රාණය ලබා දී නැගිට වීම හා අන්ධ බව හා කුෂ්ඨ රෝග සුව කළ බව සාධකයන් ඉදිරිපත් කරති.

ඒවාට පිළිතුරු වශයෙන් පහත සඳහන් කරුණු කාරණා ඉදිරිපත් කරනු ලැබේ.

## ප්‍රථමයෙන්:

මෙවැනි ප්‍රාතිහාර්යයන් සිදු වන්නේ හුදෙක් අල්ලාහ්ගේ අනුමැතියෙන් බව අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

﴿قَدۡ جِئۡتُكُم بِـَٔايَةٖ مِّن رَّبِّكُمۡ أَنِّيٓ أَخۡلُقُ لَكُم مِّنَ ٱلطِّينِ كَهَيۡـَٔةِ ٱلطَّيۡرِ فَأَنفُخُ فِيهِ فَيَكُونُ طَيۡرَۢا بِإِذۡنِ ٱللَّهِۖ وَأُبۡرِئُ ٱلۡأَكۡمَهَ وَٱلۡأَبۡرَصَ وَأُحۡيِ ٱلۡمَوۡتَىٰ بِإِذۡنِ ٱللَّهِ﴾ [آل عمران: ٤٩]

ඉස්රායීල්ගේ දරුවන්ට දූතයකු ලෙස ද (ඊසාව එවීය). “මම නුඹලාගේ දෙවියන් වෙතින් නුඹලාට සාධකයක් රුගෙන ආවෙමි. මම නුඹලා වෙනුවෙන් මැටියෙන් පක්ෂියකුගේ අනුරුවක් තනා එහි පිඹින්නෙමි. එවිට

අල්ලාහ්ගේ අවසරයෙන් (එය) පක්ෂියෙකු වනු ඇත. අල්ලාහ්ගේ අවසරයෙන් මම උපන් අන්ධ බව හා කුෂ්ට රෝගය පහ කරන්නෙමි, මළවුන් ද නැගිටුවන්නෙමි. නුඹලා අනුභව කරන දැය ද නුඹලාගේ නිවෙස්හි නුඹලා තැන්පත් කර තිබෙන දැය ද මම නුඹලාට දන්වන්නෙමි. නුඹලා විශ්වාස කළෙහු නම් මෙහි නුඹලාට සාධකයක් ඇත" (යි ඊසා පැවසීය). (ආලු ඉම්රාන්: 49)

ඒ අනුව මෙවැනි ප්‍රාතිහාර්යයන් ධර්ම දූතයින් හට ලබා දුන් අල්ලාහ්ගෙන් පමණක් දුආ ප්‍රාර්ථනා කළ යුතුයි.

## ❁ දෙවනුව:

ඉහත සඳහන් අල්කුර්ආන් වැකියෙහි ප්‍රකාශ වූ පරිදි ධර්ම දූතයින් ඔවුනට ඒ ආකාරයෙන් ප්‍රාතිහාර්යයක් ලබා දෙනු මෙන් අල්ලාහ්ගෙන් ආයාචනා කර සිටියහ.ඒ අනුව මිනිසෙකුට අනිවාර්ය වන්නේ ඔවුන්ව අනුගමනය කිරීම වේ.එනම් ඕනෑම අවස්ථාවකදී අල්ලාහ්ගෙන් පමණක් සහාය පතා ප්‍රාර්ථනා කිරීමයි. ඔවුන්ගේ ජීවන රටාව අනුගමනය කිරීම යනු ඉතා උචිත තවද අලංකාරමත් ආදර්ශයකි.

## ❁ තෙවනුව:

පෙර සඳහන් වූ සාධකයන් ඉතා පැහැදිලිව ප්‍රකාශ කර සිටින්නේ අල්ලාහ් හැර අන් අයෙකුගෙන් ආයාචනා කළ නොහැකි බවයි. එපමණක් නොව කෙනෙකුට යම් අවශ්‍යතාවයක් ඇති වී එම

අවශ්‍යතාවය සාමාන්‍ය මිනිසෙකුට සපුරා දී හැකි සුළු අවශ්‍යතාවයක් වුවද එවැනි අවස්ථාවකදී පවා මිනිසා ආරම්භයෙන් එය සපුරා දෙන ලෙස අසා සිටිය යුත්තේ අල්ලාහ්ගෙනි.

එයට අදාලව අබූ ජඃෆර් මුහම්මද් අල්බාකිර් (රහ්) තුමාණන් විසින් වාර්තා කරන ලද වාර්තාවක් මෙසේ සඳහන් වේ:

නුඹට අල්ලාහ්ගේ නිර්මාණයන් වෙත යම් කිසි සුළු අවශ්‍යතාවයක් ඇති වූ කල්හි ඔවුන්ගෙන් එය නොවිමසා ප්‍රථමයෙන් අල්ලාහ්ගෙන් විමසා සිටිනු. (කිතාබුල් මුස්තගීසීන් බිල්ලාහ් පිටු අංක 68)

8

# සාධක අංක

**සර්ව බලධාරී අල්ලාහ් ඔහුගේ දාසයින්ට ඔහුගෙන් පමණක් ආයාචනා කරනු මෙන් අණ කල ආකාරයට ඔහු නොවන අයගෙන් ආයාචනා නොකරන මෙන්ද තහනම් නියෝග පනවා ඇත.**

ඔහුගේ දාසයින් ඔවුන්ගේ සෑම විවිධ අවස්ථාවන්හිදීම ඔහු වෙත යොමු වී ඔහුගෙන්ම සහාය පතා ඔහුගෙන්ම ආයාචනා කිරීම ඔහු ඉතා ප්‍රිය කරනු ඇත.ඒ අනුව දුආ ප්‍රාර්ථනා කිරීම යනු අල්ලාහ් ඉතා ප්‍රිය කරන වන්දනාවකි.

කවරෙකු හෝ අල්ලාහ්ගෙන් ආයාචනා කරන්නේ නම් ඔහු අල්ලාහ් වෙත ඉතා ප්‍රියමනාප හා ඔහු වෙත සමීප කරවන ක්‍රියාවක් සිදු කරනු ඇත.ඒ සඳහා නබි වදන් අතුරින් සාධකයක් පහලින් සඳහන් වේ:

උත්තරීතර අල්ලාහ් සෑම රාත්‍රියකම අවසන් අහස වෙත පැමිණ මෙසේ පවසයි:

මා කැඳවන කවරෙකු හෝ සිටින්නේ නම් මා ඔහුට පිළිතුරු දෙන්නෙමි.මාගෙන් යම් දෙයක් අසන්නෙකු සිටින්නේ නම් මා ඔහුට එය ලබා දෙමි.මාගෙන් පාපොච්ඡාරණය කරන කවරෙකු හෝ සිටින්නේ නම් ඔහු සඳහා සමාව මා ලබා දෙන්නෙමි.

සහාබිවරුන්ගෙන් අධික පිරිසක් මෙම නබි වදන වාර්තා කර ඇති අතර බුහාරී හා මුස්ලිම් ග්‍රන්ථවල මෙය සඳහන් වී ඇත.මෙම නබි වදන එක් සත්‍ය පුවතකි.

සෑම රාත්‍රියකම, මනුෂ්‍යයාගෙන් අල්ප ප්‍රමාණයක් හෝ අවශ්‍යතාවයක් නොමැති පරාක්‍රමයාණන් අල්ලාහ් තම දාසයන් ඔහුව අමතා ඔහුගෙන් සහාය පතනු මෙන් ඉල්ලා සිටියි.මෙය මදක් නෙත යොමු කර අවධානම් විය යුතු දේව කරුණාවකි.

තවද මිනිසා තම දෙවියාණන්ගෙන් වූ මෙම දේව කරුණාව උපයෝගී කිරීමට දැඩි ලෙස වෙර දැරිය යුතුව ඇත.ඒ අනුව ඔහු අධික වශයෙන් දුආ ප්‍රාර්ථනාවෙහි නියලිය යුතුයි.එසේ කළේ නම් ඔහුගේ සිත් තුල විවරණයක් හා තම ආත්මය තුල ශාන්තභාවයක් හා තම දේව විශ්වාසය තුල වර්ධනයක් ඇති වේ යන්න නියතයි.සර්ව බලධාරී අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

﴿وَسۡـَٔلُواْ ٱللَّهَ مِن فَضۡلِهِۦٓۚ إِنَّ ٱللَّهَ كَانَ بِكُلِّ شَيۡءٍ عَلِيمٗا﴾ [النساء: ٣٢]

අල්ලාහ්ගෙන් ඔහුගේ දයාව පතන්න. අල්ලාහ් සියලූ දේ ගැන සර්වඥයෙක් වේ. (නිසා:32)

සර්ව බලධාරී අල්ලාහ් දැන් වූ බව නබි (සල්) තුමාණන් ප්‍රකාශ කළ නබි වදනක් මෙසේ සඳහන් වේ:

අහෝ මාගේ දාසයනි! මා හට අපරාධය මා තහනම් කර ගතිමි.නුඹලා අතරද එය තහනම් කර ඇත්තෙමි. එබැවින් නුඹලා එකිනෙකා අතර අපරාධ සිදු නොකරනු.

අහෝ මාගේ දාසයනි! මා කවරෙකුට යහ මඟ පෙන්නුම් කළේද ඔහු හැර නුඹලා සියල්ල නොමඟ ගියවුන් වෙති. එමනිසා මාගෙන් යහමග පතනු. මා නුඹලාට යහමඟ පෙන්වන්නෙමි.

අහෝ මාගේ දාසයනි! මා කවරෙකු හට ආහාර ලබා දුන්නේද ඔහු හැර නුඹලා සියල්ල කුසගින්නෙහි පසු වන්නෝ වෙති.එමනිසා මාගෙන්ම ආහාර ලබා දෙනු මෙන් ඉල්ලා සිටිනු.මා නුඹලාට ආහාර ලබා දෙමි.

අහෝ මාගේ දාසයනි! මා කවරෙකුට (ශරීරය ආවරණය කිරීම සඳහා) වස්ත්‍රය ලබා දුන්නේද ඔහු හැර නුඹලා සියල්ල වස්ත්‍රයන් නොමැති උදීවීන් වෙති.එමනිසා මාගෙන්ම වස්ත්‍ර ලබා දෙනු මෙන් ඉල්ලා සිටිනු.මා නුඹලාට වස්ත්‍ර ලබා දෙමි.

(මූලාශ්‍රය: මුස්ලිම් / වාර්තාකරු:අබූ දර් (රළි).

සුනන් ඉබ්නු මාජාවෙහි අබූ හුරයිරා (රළි) තුමා නබි (සල්) තුමාණන් වාර්තා කළ බව මෙසේ සඳහන් කරයි:

(කවරෙකු අල්ලාහ්ගෙන් අසා නොසිටින්නේද ඔහු සමඟ අල්ලාහ් කෝපයට පත් වේ)

මෙම නබි වදනෙහි එක්තරා අඩුපාඩුවක් තිබෙන හේතුවෙන් මෙම නබි වදන දුර්ලව ඝනයට අයත් වූවද මෙම නබි වදනෙහි සත්‍යතාවය ශක්තිමක් කරන බොහෝ අල්කුර්ආන් හා නබි වදන් පාඨ ඇති බැවින් ඇතැම් විද්වතුන් මෙය පිළිගත හැකි නබි වදනක් යනුවෙන් සළකති.මන්දයත් කවරෙකු හෝ

තම එදිනෙදා කටයුතු වලදී අල්ලාහ්ගෙන් සහාය පතා ආයාචනා නොකර සිටීනම් නිසැකයෙන්ම අල්ලාහ් ඔහු සමඟ කෝපයට පත් වේ. එම පුද්ගලයා අල්ලාහ්ව තම දෙවියෙකු වශයෙන් හා තම පරමාධිපතියෙකු වශයෙන් නොගත් බව එමඟින් ඔහු තහවුරු කරයි.තවද දුආ හෙවත් ආයාචනාව යනු එහි අනිවාර්ය ලෙස අල්ලාහ්ගෙන් ආයාචනා කළ යුතුයි යැයි නම් කරන ලද කොටසක් ඇත.උදාහණරයක් ලෙස අල්ලාහ්ගෙන් යහමඟ පැතීම පෙන්වා දිය හැක.මෙසේ අල්ලාහ්ගෙන් යහමඟ පැතීම අනිවාර්ය කරුණකි.ඒ පිළිබඳ අල්ලාහ් වක්‍රාකාරයින් මෙසේ අල්කුර්ආනයේ සඳහන් කරයි:

﴿ ٱهۡدِنَا ٱلصِّرَٰطَ ٱلۡمُسۡتَقِيمَ ﴾ [الفاتحة:٦]

ඍජු මාර්ගය වෙත අපට මඟ පෙන්වා දෙනු මැනව! (ෆාතිහා: 6)

ඒ සඳහා තවත් උදාහරණයක් නම් අල්ලාහ්ගෙන් පවුසමාව අයැද සිටීම වේ.

ඇතැම් විද්වතුන් කවියක් මඟින් මෙම අදහස ඉදිරි පත් කර ඇත:

දෙවියානන්ගෙන් නුඹ අයැදීම මග හැර දැමූ විට ඔහු කෝපයට පත් වේ.....

එනමුත් ආදම්ගේ පුතුන් ඔවුන්ගෙන් නුඹ අසන විට ඔවුන් කෝපයට පත් වෙති.....

# 9

# සාධක අංක

අල්කුර්ආනය හා අස්සුන්නාහ්ව අල්ලාහ්ට පමණක් සීමා වූ විෂයන් ඔහු හැර අන් අයෙකුගෙන් අයැදීම තහනම් කර ඇත්තේ කෙසේද මිනිසාගේ ස්වභාවය හා ඔහුගේ සහජ විශ්වාසයද සැකසී ඇත්තේ ඊට අදාලවයි.

කෙසේදයත් මිනිසාට තම ජීවිතයේ යම්කිසි දුෂ්කරතාවයක් හෝ කටුක අවස්ථාවක් අත් විදීමට සිදු වුවහොත් ඔහුගේ දෙවියන් වෙත අවධානම යොමු කර ඔහුගෙන් ප්‍රාර්ථනා කිරීමේ ස්වභාවික හැඟීමක් ඔහුගේ සිත තුල අල්ලාහ් දෙවියන් ඇති කර ඇත.මෙය සෑම මිනිසෙකුටම පොදු වූ සංකල්පයකි.අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන තවද ඔහුට ආදේශ තබන ඇතැමුන්ගේ ස්ථාවරය පවා මේ ආකාරයෙනි.ඒ පිළිබඳ අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

﴿هُوَ ٱلَّذِي يُسَيِّرُكُمۡ فِي ٱلۡبَرِّ وَٱلۡبَحۡرِۖ حَتَّىٰٓ إِذَا كُنتُمۡ فِي ٱلۡفُلۡكِ وَجَرَيۡنَ بِهِم بِرِيحٖ طَيِّبَةٖ وَفَرِحُواْ بِهَا جَآءَتۡهَا رِيحٌ عَاصِفٞ وَجَآءَهُمُ ٱلۡمَوۡجُ مِن كُلِّ مَكَانٖ وَظَنُّوٓاْ أَنَّهُمۡ أُحِيطَ بِهِمۡ دَعَوُاْ ٱللَّهَ مُخۡلِصِينَ لَهُ ٱلدِّينَ لَئِنۡ أَنجَيۡتَنَا مِنۡ هَٰذِهِۦ لَنَكُونَنَّ مِنَ ٱلشَّٰكِرِينَ﴾ [يونس: ٢٢]

ගොඩ බිමෙහි ද මුහුදෙහි ද නුඹලා ගමන් කරවන්නේ ඔහු ය. නුඹලා නැවෙහි සිටින්නෙහු ය. යහපත් සුළඟක් ඔවුන්

යාත්‍රා කරවයි. එමගින් ඔවුහු සතුටු වූ විට සුළි සුළඟක් ඔවුන් වෙත පැමිණෙයි. මුහුදු රළ ද ඔවුන් වෙත සෑම පසෙකින් ම පැමිණෙයි. එවිට තමන් වට කර ගන්නා ලදැයි ඔවුහු තීරණය කරති. (එම මොහොතේ දී) නැමදුම චිත්ත පාරිශුද්ධියෙන් අල්ලාහ්ට ම පිළිගන්වා “ඔබ මෙයින් අප ආරක්ෂා කළෙහි නම් අපි ඔබට කෘතඥ වන්නෙමු” යි අල්ලාහ් වෙත ඔවුහු ප්‍රාර්ථනා කරති. (යූනුස්:22)

තවද අල්ලාහ්ට ආදේශ තබන උදවිය පිළිබඳ මෙසේ පවසයි:

﴿وَإِذَا مَسَّكُمُ ٱلضُّرُّ فِي ٱلۡبَحۡرِ ضَلَّ مَن تَدۡعُونَ إِلَّآ إِيَّاهُۖ فَلَمَّا نَجَّىٰكُمۡ إِلَى ٱلۡبَرِّ أَعۡرَضۡتُمۡۚ وَكَانَ ٱلۡإِنسَٰنُ كَفُورًا﴾ [الإسراء: ٦٧]

මුහුදෙහි නුඹලාට විපතක් සිදු වූයේ නම් ඔහු හැර නුඹලා කැඳවන අය අතුරුදහන් වෙති. ඔහු නුඹලා ආරක්ෂා කොට ගොඩට ගෙන ආ විට නුඹලා පිටු පාන්නෙහු ය. මිනිසා අකෘතඥයෙක් වේ. (ඉස්රා:67)

මිනිසුන් පමණක් නොව සත්වයින්ගේ ස්වභාවය පවා අල්ලාහ් වෙත පමණක් අවධානය යොමු කර ඔහුගෙන් අයැදීම වේ යනුවෙන් අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි.

﴿فَمَكَثَ غَيۡرَ بَعِيدٖ فَقَالَ أَحَطتُ بِمَا لَمۡ تُحِطۡ بِهِۦ وَجِئۡتُكَ مِن سَبَإِۭ بِنَبَإٖ يَقِينٍ ٢٢ إِنِّي وَجَدتُّ ٱمۡرَأَةٗ تَمۡلِكُهُمۡ وَأُوتِيَتۡ مِن كُلِّ شَيۡءٖ وَلَهَا عَرۡشٌ عَظِيمٞ ٢٣ وَجَدتُّهَا وَقَوۡمَهَا يَسۡجُدُونَ لِلشَّمۡسِ مِن دُونِ ٱللَّهِ وَزَيَّنَ لَهُمُ ٱلشَّيۡطَٰنُ أَعۡمَٰلَهُمۡ فَصَدَّهُمۡ عَنِ ٱلسَّبِيلِ فَهُمۡ لَا يَهۡتَدُونَ﴾ [النمل: ٢٢-٢٤]

(එම පක්ෂියා) සුළු මොහොතක් ම පමා විය. “ඔබ නොදන්නා දෙයක් මම දැන සිටිමි. සබා නැමති ගම්මානයෙන් ස්ථිර පුවතක් මම ඔබ වෙත ගෙනැවිත් සිටිමි” යි ඌ කීවේ ය. “මම ස්ත්‍රියක් දුටුවෙමි. ඇය ඔවුන් පාලනය කරන්නීය. ඇයට සියලු දේ දෙනු ලැබ ඇත. ඇයට ඉමහත් රාජාසනයක් ද ඇත.” “ඇයත් ඇගේ ජන සමාජයත් අල්ලාහ් හැර දමා හිරුට සජ්දා කරනු දුටුවෙමි. ෂෙයිතාන් ඔවුන්ගේ ක්‍රියා ඔවුනට අලංකාර කොට පෙන්වා ඔවුන් (යහ) මාර්ගයෙන් වළක්වා ඇත. ඔවුහු යහ මග නොලබති” (යි ද ඌ කීවේ ය). (නම්ල්: 22-24)

මෙම අල්කුර්ආන් වැකියෙහි පක්ෂියෙකු වූ එම සත්වයා සත්වයෙක් වුවද එම ජනයින් අල්ලාහ් හැර දමා අන් දෙයකට වන්දනාමාන කිරීම ප්‍රතික්ෂේප කළේ කෙසේද යන්න මදක් අවධානයෙන් යුතුව සිතා බැලිය යුතුයි.මෙයින් පෙනී යන්නේ කුමක්ද යත්, අල්ලාහ්ගේ නිර්මාණයන් වන මිනිසුන්,ජින්වරුන්,කතා කළ හැකි හා කතා කළ නොහැකි සියළු ජීවීන් හා අජීවින්ගේ සහජ විශ්වාසය හා ස්වභාවය වන්නේ අල්ලාහ් හැර අන් අයෙකුට වන්දනාමාන කිරීම හෝ ආයාචනා කිරීම යනු අයුක්ති සහගත සහ සාපරාධී ක්‍රියාවකි යන්න වේ.

## 10

# සාධක අංක

ඉස්ලාම් දහම හා මිනිසාගේ සහජ විශ්වාසය අල්ලාහ් හැර අන් අයෙකුගෙන් අයැදීම අකැපයි යනුවෙන් පවසා සිටින්නේ කෙසේද එසේම මිනිසාගේ විචාර බුද්ධියද (අල්ලාහ්ට පමණක් ශක්තිය ඇති විෂයන්හි) අන් අයෙකුගෙන් අයැදී සිටීම අකැපයි යනුවෙන් දන්වා සිටියි.

කෙසේදයත් මිනිසා තම විචාර බුද්ධිය උපයෝගී කිරීම මඟින් අයැදීමට ලක් වන උදවීන්ද තමන් මෙන් මැවීමට ලක් වූ මනුෂ්‍ය ජීවීන් බව අනාවරණය කර ගනීයි.ඒ අනුව තමන් මෙන් සාමාන්‍ය මැවිමක් වන ඔවුන්ගෙන් උදවු උපකාර පතා අයැදීම හෝ ලෙඩ රෝග සඳහා නිවාරනය ලබා දෙනු මෙන් හා ආහරපාන සපයා දෙනු මෙන් ඉල්ලා සිටිය හැක්කේ කෙසේද යන්නද ඔහුට වටහා ගත හැකි වනු ඇත.

උතුම් වූ නබි (සල්) තුමාණන් පිළිබඳ අල්ලාහ් මෙසේ දන්වයි:

﴿قُلْ إِنَّمَآ أَنَا۠ بَشَرٌ مِّثْلُكُمْ يُوحَىٰٓ إِلَيَّ أَنَّمَآ إِلَٰهُكُمْ إِلَٰهٌ وَٰحِدٌ فَمَن كَانَ يَرْجُوا۟ لِقَآءَ رَبِّهِۦ فَلْيَعْمَلْ عَمَلًا صَٰلِحًا وَلَا يُشْرِكْ بِعِبَادَةِ رَبِّهِۦٓ أَحَدًۢا﴾ [الكهف: ١١٠]

මා නුඹලා මෙන් මිනිසකු පමණි. නුඹලාගේ දෙවියා එකම දෙවියකු පමණක් බව මට හෙළි දරව් කරනු ලැබ ඇත. එම නිසා තම රබ්(පරමාධිපති) මුණ ගැසීමට බලාපොරොත්තු වන අය දැහැමි ක්‍රියාවන් කළ යුතුය. තවද තම රබ්(පරමාධිපති) නැමදීමේදී කිසිවකු ආදේශ නොකළ යුතු යැයි (නබි මුහම්මද්) පවසනු. (කහ්ෆ්:110)

තවද මෙසේ පවසයි:

﴿قَالَتۡ لَهُمۡ رُسُلُهُمۡ إِن نَّحۡنُ إِلَّا بَشَرٞ مِّثۡلُكُمۡ وَلَٰكِنَّ ٱللَّهَ يَمُنُّ عَلَىٰ مَن يَشَآءُ مِنۡ عِبَادِهِۦۖ وَمَا كَانَ لَنَآ أَن نَّأۡتِيَكُم بِسُلۡطَٰنٍ إِلَّا بِإِذۡنِ ٱللَّهِۚ وَعَلَى ٱللَّهِ فَلۡيَتَوَكَّلِ ٱلۡمُؤۡمِنُونَ﴾ [إبراهيم: ١١]

අපි නුඹලා වැනි මනුෂ්‍යයින් මිස නැත. එහෙත් අල්ලාහ් ඔහුගේ ගැත්තන් අතුරින් ඔහුට අභිමත කෙනකුට අනුග්‍රහය දෙන්නේය. අල්ලාහ්ගේ අවසරයෙන් විනා නුඹලා වෙත අණබලයක් ගෙන ඒම අපට නොහැකිය. මූ:මීන්වරුන් බලාපොරොත්තු තැබිය යුත්තේ අල්ලාහ් වෙත යැයි ඔවුනට ඔවුන්ගේ රසූල්වරු කීහ. (ඉබ්රාහීම්:11)

තවද මෙසේ සඳහන් වේ:

﴿إِنَّ ٱلَّذِينَ تَدۡعُونَ مِن دُونِ ٱللَّهِ عِبَادٌ أَمۡثَالُكُمۡ﴾ [الأعراف: ١٩٤]

අල්ලාහ් හැර නුඹලා (කැඳවන) ප්‍රාර්ථනා කරන අය නියතවශයෙන්ම නුඹලා වැනි ගැත්තෝය. (අඃරාෆ්:194)

ඉහත සාකච්ඡාවට බඳුන් වූයේ මිනිස් ශක්තියෙන් තික්ම වූ අල්ලාහ්ට පමණක් සපුරා දිය හැකි විෂයන් ඔහුගෙන්

පමණක් අයැදී සිටීම යන මාතෘකාව යටතේය.එකී විෂයන්හි පමණක් නොව මිනිස් ශක්තියෙන් නික්ම නොවූ විෂයන් පවා අල්ලාහ්ගෙන් අයැදී සිටීම යනු නියම මුස්ලිම්වරයෙකුගේ සංඛේතයකි.එමඟින් නිර්මාපකයා හැර දමා නිර්මාණයන් වෙත අවධානම යොමු කිරීමෙන් වැළකී සිටිය හැක.

ශෝකයට කරුණක් නම් ඇතැම් මිනිසුන් අතර බහුල වශයෙන් දැක ගන්නට හැකි වන්නේ ලෙඩ රෝග වලට ගොදුරු වූ සැනින් යන්ත්‍ර මන්ත්‍ර,ගුරුකම් කරන්නෙකු වෙත දිව ගොස් මන්තර මැතිරීම වේ.එසේ නොව, ආරම්භයේදී කළ යුත්තේ ඉස්ලාම් දහම තුල අනුමත කළ ආකාරයෙන් තමා විසින්ම තමා හට මතුරා ගැනීම වේ.මුස්ලිම්වරුන්ගෙන් අප්‍රමාණ පිරිසක් සූරතුල් ෆාතිහා,ආයතුල් කුර්සී,කුල් සූරාහ්වන් තුන හා වෙනත් අල්කුර්ආන් පරිච්ඡේද හා වාක්‍ය පාරායනය කර තමන් හට මතුරා ගැනීමේ හැකියාවෙන් පසුවන බව බහුලව දක්නට හැකි කාරණාවකි.

එපමණක් නොව කෙනෙකු තමා විසින්ම තමා හට මතුරා ගැනීමේදී සිත් එක්තැන් කර අල්ලාහ් සමඟ සැබෑ සම්බන්ධතාවයක් ඇති කර ඉන් පසු මතුරා ගනු ඇත යන්න රහස්‍ය කරුණක් නොවේ.අල්ලාහ්ගෙන් පිළිතුරු ලැබීමට ඉතා සුදුසු ආකාරය වනුයේ මේ ආකාරයයි.මේ ආකාරයෙන් තමා විසින්ම තමා හට මතුරා ගැනීමෙන් (අල්ලාහ්ගේ පිහිට මඟින්) නීරෝගිමත් වූ පුද්ගලයින් රාශියකි.

තවත් ඇතැමුන් යම්කිසි රැකී රක්ෂාවක් අවශ්‍ය වූ කලී ප්‍රථමයෙන් එම රැකියාව ලබා ගැනීමට ලෙහෙසි කර දෙනු මෙන් තම පරමාධිපති වූ අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා නොකර එම රැකියාව ලබා ගැනීම පිණිස දායක වන එක් එක් ආධාරකරුවන් සොයා යති.මෙහිදී ගුවන් විදුලිය මඟින් ප්‍රකාශය වූ එක්තරා සත්‍ය සිදු වීමක් සඳහන් කිරීමට අපේක්ෂා කරන්නෙමි.එනම්:

එක්තරා පුද්ගලයෙකු ඔහු සඳහා රැකියාවක් අවශ්‍ය වූ හේතුවෙන් එය ලබා ගැනීම පිණිස ප්‍රභූවරුන් වෙත ගොස් ඔහු සඳහා මැදිහත් වී රැකියාවක් ලබා දෙනු මෙන් ඉල්ලා සිටියහ. එනමුත් එම ප්‍රභූවරුන් ඔහුගේ ඉල්ලීම නොසළකා හැරියෝය. මොහුගේ එදිනෙදා දෛනික ජීවිතය තවත් තවත් අසීරුවට පත් වූ විට ආගමික විද්වතෙකු වෙත ගොස් තමන් සඳහා රැකියාවක් අවශ්‍ය බව හා එය ලබා ගැනීම පිණිස මැදිහත් වනු ලෙස ඉල්ලා සිටියේය.එවිට නුඹ පළමුව අල්ලාහ් වෙත අවධානය යොමු කර ඔහුගෙන් ඉල්ලා සිටිනු මෙන් එම විද්වතා අවවාද කළේය.එම අවවාදයට අනුව එම පුද්ගලයා ෆජ්ර් සලාතයට පෙර නින්දෙන් නැගිට සලාතය කර අල්ලාහ්ගෙන් තමන්ට රැකියාවක් ලබා දෙනු මෙන් ප්‍රාර්ථනා කර සිටියහ. ඉන්පසු ප්‍රථමයෙන් තමන් හට රැකියාවක් ලබා ගැනීම පිණිස මැදිහත් වනු මෙන් ඉල්ලුම් කළ ප්‍රභූවරුන් වෙත ගිය පසු ඔහුට එම රැකියාව ලබා ගැනීමට පහසු වුණි.කෙතරම්ද කිව හොත් ප්‍රථමයෙන් ඔහු පිළිබඳ සැළකීමක් නොදැක්වූ ප්‍රභූවරුන් පවා නුඹ කොහැදැයි ඔහුව සොයන්නට වූහ.

එපමණක් නොව ඇතැම් උදවිය තමන් වෙනුවෙන් ප්‍රාර්ථනා කරනු මෙන් අනෙකාගෙන් ඉල්ලා සිටිති.එනමුත් අල්ලාහ් සෑම තනි පුද්ගලයෙකු දෙස බලා මෙසේ අණ කරයි:

﴿ وَقَالَ رَبُّكُمُ ٱدۡعُونِيٓ أَسۡتَجِبۡ لَكُمۡ ﴾ [غافر: ٦]

ඔබගේ දෙවියන් මෙසේ පවසන්නේය: ඔබ (ඔබට අවශ්‍ය දෑය සියල්ල ඉල්ලා සිටීමට) මාවම ආරාධනා කරනු. මා ඔබට, (ඔබගේ ප්‍රාර්ථනාවන්ට) පිළිතුරු දෙන්නෙමි. (ගාෆිර්:60)

﴿ وَإِذَا سَأَلَكَ عِبَادِي عَنِّي فَإِنِّي قَرِيبٌۖ أُجِيبُ دَعۡوَةَ ٱلدَّاعِ إِذَا دَعَانِۖ فَلۡيَسۡتَجِيبُواْ لِي وَلۡيُؤۡمِنُواْ بِي لَعَلَّهُمۡ يَرۡشُدُونَ ﴾ [البقرة: ١٨٦]

(නබි මුහම්මද්!) මාගේ ගැත්තන් මා පිළිබඳව නුඹෙන් විමසුවහොත් නියත වශයෙන්ම මා (ඔවුනට) ඉතා සමීපයැයි (පවසනු.) ප්‍රාර්ථනා කරන්නා (මා) අමතන විට (ඔහුගේ) ප්‍රාර්ථනාවට මම පිළිතුරු දෙමි. එබැවින් ඔවුහු ම(ගේ ඇමතීම)ට සවන් දෙත්වා. තවද මා කෙරෙහි විශ්වාස කරත්වා. (මින්) ඔවුනට නිවැරදි මඟපෙන්වීම ලබා ගත හැකිය. (බකරා:186)

අබුල් අබ්බාස් අහ්මද් බින් අබ්දුල් හලීම් තුමා මෙසේ වාර්තා කරයි:

මිනිසා වැනි අල්ලාහ්ගේ නිර්මාණයන්ගෙන් ලෞකික අවශ්‍යතාවයන් ඉල්ලා සිටීම වාජිබ් හෝ මුස්තහබ් හෝ නොවනු ඇත.ඔහුට අනිවාර්ය වන්නේ ඍජුව අල්ලාහ්ගෙන්

අයැදීි ඔහු මත විශ්වාසය තැබීමයි.සැබැවින්ම මිනිසා වැනි අල්ලාහ්ගේ නිර්මානයන්ගෙන් ඉල්ලා සිටීම යනු ඉස්ලාම් දහම තුල තහනම් වූ ක්‍රියාවකි. එසේ වූවද ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත්තේ මිනිසාගේ දැඩි අවශ්‍යතාවය හේතුවෙනි.එබැවින් අල්ලාහ් මත බලාපොරොත්තුව තබා මිනිසාගෙන් හෝ අන් විෂයන්ගෙන් අයැදී නොසිටීම ඉතා ශ්‍රේෂ්ඨය.අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

﴿فَإِذَا فَرَغۡتَ فَٱنصَبۡ ٧ وَإِلَىٰ رَبِّكَ فَٱرۡغَب﴾ [الشرح: ٧، ٨]

(මෙලොව කාර්යයන් හා ප්‍රචාරක කටයුතු) අවසන් කලේනම් උද්යෝගිමත්ව නැඟී සිටින්න. ඔබගේ රක්ෂිතයා කෙරෙහි බලාපොරොත්තු තබන්න. (ශරහ්:7/8)

අල්ලාහ් අප සැමට භාග්‍ය ලබා දෙත්වා.!!!!!!

ආමීන්

IslamHouse.com

@IslamHousesi islamhousesi islamhouse.com/si/

IslamHouse-153825271615795 channel/UCIkxdDcIBpRBNSqaykgwhmQ

For more details visit
www.GuideToIslam.com

GUIDE TO ISLAM

contact us :Books@guidetoislam.com

Guidetolslam.org Guidetoislam1 Guidetoislam www.Guidetoislam.com

المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة

هاتف: ٩٦٦١١٤٤٥٤٩٠٠+ فاكس: ٩٦٦١١٤٩٧٠١٢٦+ ص ب: ٢٩٤٦٥ الرياض: ١١٤٥٧


ISLAMIC PROPAGATION OFFICE IN RABWAH

P.O.BOX 29465 RIYADH 11457 TEL: +966 11 4454900 FAX: +966 11 4970126

## ඒකීය අල්ලාහ් වෙත පමණක් නැඹුරු වීම අනිවාර්ය බව හඟවන

# පැහැදිලි සාධකය

මෙම කුඩා පොත් පිංචය අෂ් ෂෙයික් අබ්දුල්ලාහ් බින් අබ්දුර්රහ්මාන් අස් සඅද් තුමාණන් විසින් රචනා කළ එකකි. දුආ ප්‍රාර්ථනාවෙහි වැදගත්කම හා එය අල්ලාහ්ගෙන් පමණක් ඉල්ලා සිටිය යුතු බවට සාධකයන් මෙහිදී ඉදිරිපත් කර ඇත.තවද අල්ලාහ් නොවන අයගෙන් ප්‍රාර්ථනාවන් ඉල්ලා සිටිය හැකි බවට වාද විවාද කරන්නන් සඳහා නියමාකාරව පිළිතුරු සපයා ඇත.




IslamHouse.com
Osoul Center
www.osoulcenter.com